# රාජ්‍ය දැව සංස්ථාව (STC)

# අභිලාෂ ප්‍රකාශ කිරීම (EOI) සඳහා ආරාධනයයි

## රාජ්‍ය දැව සංස්ථාව (STC) සඳහා ඒකාබද්ධ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ (BPR) සහ ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ (ERP) විසඳුමක් සැලසුම් කිරීම, සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණ පද්ධති සේවා සැපයුම්කරුවන්ගෙන් අභිලාෂ ප්‍රකාශ කිරීම (EOI) සඳහා ආරාධනා කිරීම

**ප්‍රසම්පාදන අංක : STC/PSM/2025/PRO-15**

**හැඳින්වීම**

1. රාජ්‍ය දැව සංස්ථාව (STC) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1968 අප්‍රේල් මාසයේදී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික හා පාරිසරික අවශ්‍යතා සඳහා දායක වෙමින්, කාලයත් සමග ලබාගත් දැනුම හා කුසලතා තුළින් දැව හා දැව මත පදනම් වූ නිෂ්පාදන පාරිභෝගිකයින්ට ලබා දීම සඳහා STC විශිෂ්ට සේවාවක් සපයයි.

2. වර්තමාන ඩිජිටල්කරණ සන්දර්භය තුළ, වේගවත්, යාවත්කාලීන සහ නිවැරදි ඒකාබද්ධ ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ (ERP) විසඳුමක් තිබීම සහ ව්‍යාප්තිය අවශ්‍ය වේ. එය ප්‍රතිපත්ති සම්පාදකයින්ට සුදුසු තීරණ ගැනීම සඳහා මෙන්ම පොදු ආයතන හරහා පිරිවැය-කාර්යක්ෂම සහ සතුටුදායක සේවා සැපයීම සඳහා ද අත්‍යවශ්‍ය වේ.

3. එබැවින්, ඉහත සඳහන් ERP අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණ උපදේශක විශේෂඥයින්ගේ සහාය ලබා ගැනීමට STC තීරණය කර ඇත.

**4. අපේක්ෂිත අරමුණු**

I. STC හි සියලුම ක්‍රියාකාරී අංශ හරහා පවතින ව්‍යාපාර ක්‍රියාවලි විශ්ලේෂණය කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ හොඳම භාවිතයන් සමග ගළපා ගැනීම සඳහා ඒවා ප්‍රතිනිර්මාණය කිරීම.

II. STC හි මෙහෙයුම් සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කරන මොඩියුලර් පරිමාණය කළ හැකි සහ ආරක්ෂිත ERP විසඳුමක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

III. ERP පද්ධතිය නවීන, විවෘත-ප්‍රමිති තාක්ෂණයන් භාවිතා කරමින් සංවර්ධනය කර ඇති බවත්, මාර්ගගත ක්‍රමවේද හරහා ප්‍රවේශ විය හැකි බවත් සහතික කිරීම.

IV. වසර 10ක කාලයක් සඳහා දිගුකාලීන නඩත්තුව, පද්ධති යාවත්කාලීන කිරීම් සහ ධාරිතා සංවර්ධනය සඳහා සහාය වීම.

**5. සුදුසුකම් නිර්ණායක**

EOI ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලැබීමට, සාර්ථක තොරතුරු පද්ධති සේවා සැපයුම්කරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතුය. සුදුසුකම්ලත් සේවා සැපයුම්කරු සඳහා වන සුදුසුකම් නිර්ණායක පහත සඳහන් ද ඇතුළත් විය යුතුය. (අමතර සුදුසුකම් අවශ්‍යතා EOI කැඳවීමේ ලේඛනවල දක්වා ඇත).

**a) සාමාන්‍ය පළපුරුද්ද**

i. අභිලාෂ ප්‍රකාශ කිරීම් ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව පිහිටුවා ඇති සුදුසුකම්ලත් තොරතුරු තාක්ෂණ සේවා සැපයුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය.

ii. යෝජිත IS විසඳුම් සේවා සපයන්නාට පසුගිය වසර දහය (10) තුළ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සිදු කරන ලද මෘදුකාංග සංවර්ධනය හා සේවා සැපයීම කිරීමේ අවම වශයෙන් වසර හතක (7) පළපුරුද්දක් තිබිය යුතුය.

**b) විශේෂිත පළපුරුද්ද:**

i. IS පද්ධති පසුගිය වසර දහය (10) තුළ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය (BPR) පද්ධති ක්‍රියාත්මක කිරීම සමඟ ඒකාබද්ධ වූ අවම වශයෙන් කාර්යයන් දෙකක් (2) සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. පද්ධති සැපයුම්කරු අවම වශයෙන් පද්ධති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති දෙකක් (02) සාර්ථකව සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඒ සඳහා යොමු ලිපි තිබිය යුතුය. එක් එක් ව්‍යාපෘතියේ අවම වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන හතළිහකට (40) වඩා අඩු නොවිය යුතු අතර, එම ව්‍යාපෘති ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනට පෙර පසුගිය වසර දහය (10) තුළ සම්පූර්ණ කර තිබිය යුතුය.

**c) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම සහ මූල්‍ය සම්පත්**

- සමාගම පසුගිය වසර පහ (5) තුළ අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන හැත්තෑපහක (75) සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් තිබිය යුතු අතර, පසුගිය වසර පහ (5) තුළ සාමාන්‍ය කාර්යය ප්‍රාග්ධනය (වත්මන් වත්කම් - වත්මන් වගකීම්) ශ්‍රී ලංකා රුපියල් මිලියන දෙළහක් (12) විය යුතුය.

**d) ගුණාත්මක සහ ආරක්ෂක අවශ්‍යතා**

iii. ලංසුකරු ISO 9001:2015 සහ ISO 27001 සහතික ලබා තිබිය යුතුය.

**6. අභිලාෂ ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටිය**

අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) සඳහා සම්පූර්ණ ලංසු ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් උනන්දුවක් දක්වන උපදේශන ආයතනවලට **ශ්‍රී ලංකා රුපියල් 12,500.00** ක ගාස්තුවක් ගෙවා 2025 සැප්තැම්බර් 03 දින සිට **පෙරවරු 9.00 සිට පස්වරු 3.00** දක්වා, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, 'සම්පත් පාය', රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයෙන් ලබාගත හැක.

සම්පූර්ණ කරන ලද EOI ලේඛන 2025 ඔක්තෝබර් 04 වන දින ප.ව. 2.00ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනවිත් භාර දිය යුතුය. මෙම කාර්යය පිළිබඳ වැඩිදුර තොරතුරු කාර්යාල වේලාවන් තුළදී කළමනාකරු (තොරතුරු තාක්ෂණ) 0772361513 අමතා ලබාගත හැක.

**සභාපති ,**
**රාජ්‍ය දැව සංස්ථාව.**